**පිවිතුරු බලශක්ති හා ජාල කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (7 වන කොටස) – 2018**
---------------------------------------------------------------------------------------------------------------

පිවිතුරු බලශක්ති හා ජාල කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ (7 වන කොටස) 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ලංකා විදුලිබල මණ්ඩලය හා සුනිත්‍ය බලශක්ති අධිකාරිය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2013 මැයි 08 දින එළඹි අංක එස්.ආර්.අයි 43576 දරන ණය ගිවිසුම සහ ව්‍යාපෘති ගිවිසුමේ 2.09 (අ) (ii) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කල යුතු යැයි මා සළකන මාගේ අදහස් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලසීමාව**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, විදුලිබල බලශක්ති හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ලංකා විදුලිබල මණ්ඩලය හා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ක්‍රියාත්මත කිරීමේ ආයතනයන් වේ. ශ්‍රී ලංකාවේ පිවිතුරු විදුලිබල සැපයුම ඉහළ නැංවීම සහ විදුලිබල බෙදාහැරීමේ කාර්යක්ෂමතාව සහ විශ්වාසනීයත්වය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 200 කට සමාන රු.මිලියන 25,240 ක් වන අතර එයින් ඇමරිකානු ඩොලර් මිලියන 3.00 කට සමාන රු.මිලියන 3,786 ක මුදලක් ව්‍යාපෘතියේ 07 වන කොටස සඳහා වෙන් කර ඇත. ව්‍යාපෘතියේ කටයුතු 2013 සැප්තැම්බර් 30 වන දින ආරම්භ කර ඇති අතර එය 2017 ජූනි 30 වන විට අවසන් කිරීමට නියමිත වුවත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කරන දිනය 2019 ජූනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 මතය**

ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ව්‍යාපෘතිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

ව්‍යාපෘතිය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. භෞතික ප්‍රගතිය**

**2.1 ව්‍යාපෘතියේ කටයුතුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය**

ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව, දිවයින පුරා වහළය මත සූර්යබල උත්පාදන පද්ධතිය ප්‍රචලිත කිරීමේ අපේක්ෂාව ඇතිව තෝරාගත් ජාතික විශ්ව විද්‍යාල 04 ක සූර්යබල උත්පාදන පද්ධතීන් වහලය මත ස්ථාපනය කිරීම සහ සූර්යබල උත්පාදන පද්ධති ස්ථාපිත කිරීම සඳහා හෝටල්, වාණිජ ආයතන වැනි පෞද්ගලික අංශයේ සහභාගී වන්නන්ට පහසුකම් සැලසීම අරමුණ විය. 2014 දෙසැම්බර් 31දින වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබූ ව්‍යාපෘතියේ කටයුතු ව්‍යාපෘතියේ කටයුතු වසර 04ක් ප්‍රමාද වී එනම් 2018 දෙසැම්බර් 31 දින වන විට අවසන් කර තිබුණි. තවදුරටත්, 2016 මැයි මාසයේදී නිමකිරීමට නියමිතව තිබූ පුද්ගලික සමාගමකට ප්‍රදානය කරන ලද සූර්යබල පද්ධති ස්ථාපනය කිරීමේ කොන්ත්‍රාත්තුව 2017 ඔක්තෝම්බර් මාසයේදී අවසන් කිරීමට කර තිබූ අතර ඒ සඳහා වන කොන්ත්‍රාත්තුව නිම කිරීමේ සහතිකය 2018 ඔක්තෝබර් 15 වන දින නිකුත් කර තිබුණි.

**2.2 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>**

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| ------------------ | ------------ | ---------------- | ------------ |
| විශ්ව විද්‍යාලවල සූර්යබල උත්පාදන පද්ධති වහල මත ස්ථාපනය කිරීම සඳහා වන කොන්ත්‍රාත්තු අවසන් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම හෝ ගිවිසුම අවසානයේ ප්‍රමාදය මත කාර්යසාධන සුරක්ෂණය අයකර ගැනීම සහතික කිරීම සඳහා කිසිදු සනාථ කිරීමේ සාක්ෂි ලබාදී නොමැත. | කොන්ත්‍රාත් කොන්දේසි උල්ලංඝනය කිරීමේදී කොන්ත්‍රාත්කරුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගත නොහැකි වනු ඇත. | අඛණ්ඩව කොන්ත්‍රාත්කරුගේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට පියවර ගෙන තිබුණි. | කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ සාක්ෂිමය වාර්තා නඩත්තු කිරීමට සංවේදනය කරයි. |

**3.3 පද්ධති හා පාලනයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| | ------------------ | ------------ | ---------------- | ------------ |
| (අ) | මුදල් හා සැලසුම් අමාත්‍යාංශයේ අංක එම්ඕඑන්පී/ඊආර්ඩී/2007/02 දරන 2007 අගෝස්තු 07 දිනැති චක්‍රලේඛයට අනුව ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන සෑම මූල්‍ය | චක්‍රලේඛනයේ දක්වා ඇති ප්‍රධාන අවශ්‍යතාවය | විෂය ක්ෂේත්‍රයට විශේෂිත වූ වෘත්තීය කාර්ය | විගණනය සඳහා නියමිත දිනට පෙර මූල්‍ය |

| | | | | |
|---|---|---|---|---|
| | වර්ෂයකම මාර්තු 31 හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතුය. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන 2019 ජූලි 26 වන දින ඉදිරිපත් කර තිබුණි. | සම්පූර්ණ කර නොමැත. | මණ්ඩලයේ හිඟකම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට සකස්කර ඉදිරිපත් කිරීමට නොහැකි විය. | ප්‍රකාශන ඉදිරිපත් කල යුතුය. |
| (ඇ) | මුදල් රෙගුලාසි 134(3) අනුව ව්‍යාපෘතියේ ගනුදෙනු අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනය කර නොමැත. | ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයන් නිසි ලෙස ක්‍රියාත්මක නොවීමට හේතුවිය හැක. | අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය මණ්ඩලයේ හිඟකම හේතුවෙන් ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් පිළිබඳ පුළුල් විගණනයක් සිදු නොවීය. | ව්‍යාපෘතියේ අරමුණු කාර්යක්ෂමව හා පලදායී ලෙස සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම සඳහා විගණනය කල යුතුය. |